# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,715 — 1966 සැප්තැම්බර් 30 වැනි සිකුරාද — 1966.9 30

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් — — — | — | පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම — — | 142 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම — — — | — | මුදල් නඩු පිළිබඳ දැන්වීම — — — | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | 141 | නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... — — | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම් — | 141 | නොතාරිස් ලැයිස්තුව — — — | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම — — | — | විවිධ දැන්වීම ... — — — | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම — — | — | | |


## ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ අධිකරණ වාර

උසාවි. ආඥාපනතේ 26 වැනි ඡේදයෙන් මා වෙත පැවරි බලයෙන් අග්‍රවිනිශ්චයකාර ධූරන්ධර මිලියානි ක්ලෝඩ් සන්සෝනි වන මම, ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර මණ්ඩලයේ අදහස් විමසා එයට සෑහෙන කරුණු පෙනී, ශ්‍රේෂ්ඨාධිකරණයේ බටහිර චාරිකාව සඳහා 1966 ඔක්තෝබර් මස 10 වැනි සඳුදා සිට කොළඹදී පැවැත්වීමට නියමිත අපරාධ අධිකරණ වාරයට අමතරව, එදින සිට මීගමුවේදී තවත් අපරාධ අධිකරණ වාරයක් පැවැත්වීමට නියෝග කරමි.

ඇම්. සී. සන්සෝනි,
අග්‍රවිනිශ්චයකාර.

1966 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹදීය.

9-1123

## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම්

### වටිනාකමක් නැති ලේඛන විනාශ කිරීම

1936 වර්ෂය තුළ ගම්පොළ මහේස්ත්‍රාත් උසාවියේ පවරන ලද පහත සඳහන් අංක දරණ නඩු වාර්තා හැර, අංක 10123 සිට 10499 දක්වා ඇති නඩු වාර්තා මෙම දැන්වීමේ සඳහන් දිනයේ සිට තුන් මසක් ගත වූ පසු, වටිනාකමක් නැති ලේඛන විනාශ කිරීමේ ආඥාපනතේ විධිවිධාන අනුව විනාශ කරන බව මින් දැනුම් දෙනු ලැබේ.

යම්කිසි නඩු වාර්තාවක් පිළිබඳව සැලකිලිමත් වන කෙනෙකුට, එබඳු නඩු වාර්තාවක් විනාශ නොකරන ලෙස, පෞද්ගලිකව, නීතිඥ මහතකුගේ මාර්ගයෙන් හෝ දිවුරුම් පෙත්සමක් මගින් ද, සෑහෙන කරුණු ඉදිරිපත් කිරීමෙන් ඉල්ලා සිටිය හැක.

10132, 10275, 10326 සහ 10402

1966 සැප්තැම්බර් මස 30 වැනිදා,
ගම්පොළ මහේස්ත්‍රාත් උසාවියේ දිය.

කේ. සී. ඊ. ද අල්විස්,
මහෙස්ත්‍රාත්.

9-1161

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

141—බී 66443—5,553 (66/9)

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## දකුණු පළාත

### මාතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

තල් අරඹ/විදාන ගමාච්චිගේ පේද්‍රික් අප්පුහාමි......පැමිණිලිකාරයා.

නොම්මරය ඇම්. ඇස්. 190. එදිරිව

මාතර, හිත්තට්යේ, අකුරැස්ස පාරේ අංක 64/මැන්දිස් සිල්වා එදිරිවීර ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරයාට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් රුපියල් 1,002.49ක් අයකරගැනීම පිණිස වර්ෂ 1966 ක්වූ ඔක්තෝබර් මස 24 දින සවස 3 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මාතර, අකුරැස්ස පාරේ පදිංචි මෙන්දිස් සිල්වා එදිරිවීර නමැති අයට අයිති, මාතර අකුරැස්ස පාරේ අංක 64 දරන ස්ථානයේ සීමාසහිත හීන්ත් ටුවර්ස් සමාගමේ කොටස් තිහ වේ.

එී. ඒ. සහබන්දු,
මාතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ සැප්තැම්බර් මස 15 වෙනි දින,
මාතර පිස්කල් කන්තෝරුවේදීය.

9-1191

---

## වයඹ පළාත

### කුලියාපිටියේ පවත්වන කුරුණෑගල දිස්ත්‍රික් නඩුශාලාවේදීය

කුලියාපිටිය දිස්ත්‍රික් උසාවියේ අංක 7/වී. බුදල් නඩුවේ පී. ඒ. රූපසිංහගේ බුදල්බලකාර රිට්ටාදෙනියේ පදිංචි ඊ. ඇම්. මිචෝනෝනා ........................................ පැමිණිලිකාරිය.

නොම්මරය: 1055/ඇම්.බී. එදිරිව

කරඳපත්තුකෝරලේ කනුකැටිගෙදර පදිංචි ඊ. ඒ. පොඩිසිංඤෝ ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස 2 දින පස්වරු 3 ට ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

විත්තිකරු විසින් පැමිණිලිකරුවෙත 1954.7.31 වැනි දින ආර්. එම්. ගුණවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කළ අංක 23998 දරණ උකස්කරය පිට නඩු පවරා 64.9.10 වැනි දින ලබාගත් නඩු තීන්දුව යටතේ කුරුණෑගල දිස්ත්‍රික් උසාවියෙන් නිකුත් කළ 65.12.10 වැනි දින දරණ විකිණීමේ නියෝගය සඳහන් පරිදි අයකර ගැනීමට නියම කළ මුදල රුපියල් 980 ක්ද 63. 10. 26 වැනි දින සිට ගෙවා නිදහස් වනතුරු නීති පොලියද නඩු ගාස්තුව රුපියල් 363.62 ක්ද පිස්කල් ගාස්තු ආදිය අයකරගැනීමටය.

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ කරඳපත්තුකෝරලේ කනුකැටිගෙදර පිහිටා තිබෙන පහල කුඹුර කියන වී පැල් 2 ක් පමණ වපසරිය ඇති කුඹුරට මායිම්:—උතුරට: හේරත්හාමි හිටපු ආරච්චිට සහ තවත් අයට අයිති සිරිවේදියවෙල කියන කුඹුර; නැගෙනහිරට: ඩිංගිරිබණ්ඩාට සහ තවත් අයට අයිති ඇහැටුගහකුඹුර සහ ඩිංගිරිබණ්ඩාට සහ තවත් අයට අයිති තුම්පැල කුඹුර; දකුණට: තලගහවත්ත කියන ඉඩම සහ තෝතිස් අප්පුට අයිති ඉඩම; බස්නාහිරට: කුඹුර සහ පුන්චිප්පුහාමිට සහ තවත් අයට අයිති ඉඩම සහ කුඹුර යන මෙකී මායිම් තුල පිහිටි කුඹුර සහ ඊට අයිති සියල්ලෙන් නොබෙදූ 7/12 පංගුව. ලියාපදිංචි කළ අංකය: සී. 769/242.

ඒ. බී. රාජනායක,
වයඹ පළාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ සැප්තැම්බර් මස 18 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

9-1200

---

### කුරුණෑගල දිස්ත්‍රික් නඩුශාලාවේදීය

තිරගන් දහය කෝරලේ තල්කොටේ පදිංචි ඒ. ඇම්. අබේරත්න ........................................................ පැමිණිලිකාරයා.

නොම්මරය: 2478/ඇම් එදිරිව

තිරගන් දහය කෝරලේ තල්කොටේ පදිංචි බී. ඇම්. දේවත් ද........ ........................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ ඔක්තෝබර් මස 24 දින පස්වරු 3 ට ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැළඹවිල් ලිහත් පත්තුවේ තිරගන් දහය කෝරලේ තල්කොටේ තිබෙන ගිටිනා වත්ත අ. 1, රූ. 3, ප. 35 ක් විශාල ඉඩමට මායිම්:—උතුරට: දියබස්නාව සහ මැනික්හාමිගේ කුඹුර; නැගෙනහිරට: ගම්සභා පාර; දකුණට: නො. 1244 දරන ප්ලෑනේ ලොට් 2 දරන කොටස; බස්නාහිරට' සී. ඇම්. සී. තල්කොටේ සහ තවත් අයගේ කුඹුර.

අයකිරීමට තිබෙන මුදල රුපියල් 827.85 ක් හා පිස්කල් ගාස්තු යනාදියත්.

ඒ. බී. රාජනායක,
වයඹ පලාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ සැප්තැම්බර් මස 17 දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේදීය.

9-1196

---

1966 සැප්තැම්බර් මස 2 වැනි දින අංක 14,711 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණලද වර්ෂ 1966 අගෝස්තු මස 19 වැනි දින දරණ නිවේදනයේ සඳහන් පිස්කල් විකිණීමේ නඩු අංකය කුරුණෑගල දිස්ත්‍රික් උසාවි 19701/පී නොව 10701/පී බව මෙයින් නිවේදනය කරමි.

ඒ. බී. රත්නායක,
වයඹ පලාතේ පිස්කල් වෙනුවට.

පිස්කල් කාර්යාලය,
කුරුණෑගල, 66.9.19.

9-115

---

### කුලියාපිටිය දිස්ත්‍රික් නඩුශාලාවේ දීය

කුලියාපිටිය දිස්ත්‍රික් උසාවියේ අංක 7/වී බුදල් නඩුවේ පී. ඒ. රූපසිංහගේ බුදලේ බලකාර රිට්ටාදෙනියේ පදිංචි ඊ. ඇම්. මිචෝ නෝනා ........................................ පැමිණිලිකාරයා.

නොම්මරය 1056/ඇම්. බී. එදිරිව

දහනැක්ගෙදර පදිංචි එච්. එම්. ජයතුහාමි ................විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස 16 දින පස්වරු 3 ට ඉඩමේදී, විත්තිකරු විසින් 54.12.3 වෙනි දින ආර්. එච්. ගුනවර්ධන ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කළ අංක 24738 දරණ උකස් ඔප්පුව පිට පැමිණිලිකරු වෙත උකස් කරන ලද උකස් කරයට නඩුපවරා 64.10.14 වෙනි දින ලබාගත් නඩු තීන්දුව යටතේ කුලියාපිටිය දිස්ත්‍රික් උසාවියෙන් නිකුත්කළ 65.12.10 වෙනි දින දරණ විකිණීමේ නියෝගයේ සඳහන් පරිදි අයකරගැනීමට නියම කළ මුදල රුපියල් 980 ක්ද, 63.10.26 වෙනි දින සිට ගෙවා නිදහස්වනතුරු නීතිපොලියද නඩුගාස්තුව රුපියල් 371.27 1/2 ක්ද පිස්කල් ගාස්තු ආදියද අයකර ගැනීමට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ කරඳපත්තුකෝරලේ රිට්ටාදෙනිය යන ගම පිහිටි මහවෙල ඉහල කුඹුර වී අමුනක වපසරියට මායිම්—උතුරට: මුදලිහාමිගේ කුඹුර; නැගෙනහිරට: කිරිහාමි ආරච්චිගේ කුඹුරේ බෙලිවැටියද; දකුණට: මුදලිහාමිගේ කුඹුර; බස්නාහිරට: ගන් සූරිය ගහට කෙලින් තිබෙන නියර යන මෙකී මායිම් තුල කුඹුරෙන් නොබෙදූ 1/2 පංගුවෙන් නොබෙදූ 1/4 පංගුව. ලියාපදිංචි කළ අංකය: සී. 253/154.

ඒ. බී. රාජනායක,
වයඹ පලාතේ පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ක්වූ සැප්තැම්බර් මස 19 වෙනි දින,
කුරුණෑගල පිස්කල් කන්තෝරුවේ දීය.

9-1270

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. එහි දක්වෙන නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අයවෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පලකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.

### උපලේඛනය

**1966**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අගෝස්තු | 66. 8. 5 | සිකුරාද | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.12 | සිකුරාද | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.19 | සිකුරාද | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 8.26 | සිකුරාද | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 66. 9. 2 | සිකුරාද | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9. 9 | සිකුරාද | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.16 | සිකුරාද | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.23 | සිකුරාද | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66. 9.30 | සිකුරාද | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 66.10. 7 | සිකුරාද | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.14 | සිකුරාද | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.20 | බ්‍රහස්පතින්ද | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.10.27 | බ්‍රහස්පතින්ද | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | 66.11. 3 | බ්‍රහස්පතින්ද | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.10 | බ්‍රහස්පතින්ද | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.18 | සිකුරාද | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | 66.11.25 | සිකුරාද | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | 66.12. 2 | සිකුරාද | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12. 9 | සිකුරාද | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.16 | සිකුරාද | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 66.12.23 | සිකුරාද | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | 66.12.30 | සිකුරාද | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1966 ජුලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි නැගෙණහිර කඩදාසි කර්මාන්ත සංස්ථාවෙහි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.